# රුසියාවේ බුරියාතියා ජනරජයේ බුදුදහම

පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි[1]

## Abstract

The main objective of this article is to analyze the historical development of Buddhism. in the different regions of Russia such as Buryatia. Kalmykia, Eastern Siberia, and the Far East Russia as well. The official religion of the Russian Empire, the Russian Orthodox Church, and the colonial religious policy of the Russian imperial power towards Buddhism, etc. are discussed in detail. The October Revolution that opened new avenues for the development and dissemination of Buddhism in the different regions of Russia as well as the decline of the spread of Buddhism in 1930 are remarkable facts in the history of Buddhism in Russia. The Great Patriotic War against Nazi Germany and the beginning of the Thaw period and the modern religious situation in the Russian Federation also have a great impact on the historical development and decline of Buddhism in Russia.

In general, this article chronologically covers a fairly long period of Russian history such as Russian imperial power, the

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, නූතන භාෂා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

establishment of the Soviet Union, and the modern Russian Federation, that, has a great impact on the history of Buddhism in Russia. An analysis is carried out on ethnography, foreign policy, property policies, ideological as well as the political character of Russia.

**keywords:** Buddhism, Buryatia, Historical, Regions, Russia

වර්ග කිලෝමීටර් මිලියන 17.1ක් පුරා පැතිරි භූමි ප්‍රදේශය අනුව ලෝකයේ විශාලතම රාජ්‍යය වන්නේ රුසියාවයි. නැගෙනහිර යුරෝපීය රාජ්‍යයක් ලෙස පොදුවේ පිළිගැනුණ ද රුසියානු රාජ්‍යයේ දේශසීමා යුරෝපා හා ආසියානු යන මහාද්වීප ද්විත්වය ම ඔස්සේ වැටී පවතී. මෙකී මහාද්වීප දෙක වෙන් කෙරෙන සීමාව හෙවත් යුරෝපා මහාද්වීපයේ නැගෙනහිර සීමාව වනුයේ රුසියානු රාජ්‍යය මැදින් නිර්මාණය වී ඇති උරාල් (යූරල්) කඳු වැටියයි. එකී භූගෝලිය පිහිටීම විසින් එරටේ පොදු සංස්කෘතියේ ස්වභාවයන් අධිනිශ්චය කෙරී තිබේ. ඒ අනුව, රුසියානු ජාතිකයින්ගේ ප්‍රධාන ඇදහිල්ල බවට ක්‍රි.ව.988 දී පත්වනුයේ ග්‍රීක-ඕර්තඩොක්ස් ආගමයි. එය කිතුනු සමයේ මුල් ඇදහිල්ල ලෙස විශ්වාස කෙරේ. එය කිතුනු ශාසනයේ ප්‍රධාන ප්‍රවණතාවන් දෙකෙන් එකකි. රුසියානු අධිරාජ්‍යය ගොඩනැඟීමේදී ප්‍රමුඛ ආගම බවට පත්වනුයේ රුසියානු ඕර්තඩොක්ස් නිකායික ඇදහිල්ලයි. එකී අධිරාජ්‍යය භූගෝලීව වශයෙන් ව්‍යාප්ත වීමේදී මධ්‍ය ආසියාතික රාජ්‍යයන් ඇතුළත් කරගන්නා ලද්දෙන් ඉස්ලාමය ද රුසියානු අධිරාජ්‍යයේ එක් ප්‍රධාන ආගමක් බවට පත්විය. ජපානය, මොංගෝලියාව සහ චීනය දක්වා වූ ඈත පෙරදිග භූමි ප්‍රදේශ සහ දකුණුදිග ප්‍රදේශ රුසියානු අධිරාජ්‍යයට ඈඳ ගැනීමේදී බෞද්ධ ප්‍රදේශ ද එකී රාජ්‍යයට ඇතුළත් විය. එනයින් මහායානික බුදුසමය ද රුසියානු අධිරාජ්‍යයේ ආගම් පද්ධතියට එකතු විය. මෙකී පසුබිමෙහි රුසියානු අධිරාජ්‍යයේ නිල තත්ත්වය හිමි ඕර්තඩොක්ස් කිතුනු නිකාය සහ එකී ආගම් පමණක් නොව ඈත පෙරදිග සහ සයිබීරියානු ප්‍රදේශවල ඇදහිල්ලක් ව තිබෙන ශමාන් ආගම අතර ද ඇති වූයේ අතිශය සංකීර්ණ

අන්‍යෝන්‍ය සම්බන්ධතාවකි. මෙම ලිපියෙහිලා අවධානය යොමු කෙරෙනුයේ බුදුසමය සමඟ පැවති එකී අන්තර් සම්බන්ධතාවන්ගේ විකාශනය පිළිබඳ අධ්‍යයනය කිරීමට ය.

රුසියාවේ ප්‍රදේශ රාශියක බුදුසමය ව්‍යාප්තව පවතී. එනම් බුරියාතියා ජනරජය, ඉර්කුත්ස්ක් සහ චිතා පරිපාලන පළාත්, කල්මිකියා ජනරජය සහ අල්තායි පළාතයි. එම ප්‍රදේශ සාම්ප්‍රදායික බුදුසමය ව්‍යාප්ත ප්‍රදේශ වේ. මීට අමතරව වර්තමානයෙහි රුසියාවේ ප්‍රධාන නගරයන්හි කුඩා බෞද්ධ පිරිස් ව්‍යාප්තව සිටින අතර, ඒ අතරින් මොස්කව් සහ ශාන්ත පීටර්ස්බර්ග් නගර ප්‍රධාන ය.

ආසියාව තුළ රුසියානු අධිරාජ්‍යයේ භූ-දේශපාලන අවශ්‍යතාවන් සංකේතවත් කරමින් 1915 දී එකල රුසියාවේ අගනුවර වූ ශාන්ත පීටර්ස්බර්ග් නගරයෙහි යුරෝපයේ පළමු බෞද්ධ විහාරය ඉදිකර විවෘත කරනු ලැබිණි. පුණ්‍යාධාර මඟින් ඉදිකරනු ලැබූ එකී ව්‍යාපෘතියට රුසියාවේ ප්‍රකට බෞද්ධ පර්යේෂකයින් වූ සෙර්ගේයි ඕල්ඩන්බර්ග්, ෆියෝදර් ශෙර්බත්ස්කෝයි, නිකොලායි රේරිහ් වැන්නන් සම්බන්ධවීම, ඊට පෙර සමයේ සිට බුදුසමය කෙරේ රුසියානු බුද්ධිමතුන් තුළ පැවති උනන්දුව විදහා දක්වන්නක් විය2. එමඟින් අද පැතිර පවත්නා තිබ්බත, ජපාන, චීන, කොරියානු පමණක් නොව, හීනයානික හා ථෙරවාද ආදී විවිධ බෞද්ධ ගුරුකුල සම්ප්‍රදායයනට පදනම වැටිණි.

රුසියාවේ සාම්ප්‍රදායිකව අදහනු ලබන බෞද්ධ නිකාය හැඳින්වෙනුයේ ගෙලුග් (ගෙලුග්පා) යන නමිනි. එහි අරුත වනුයේ 'ගුණධර්ම' නිකාය යනුයි. එම නිකායයට අයත් භික්ෂූන් වහන්සේගේ හෙවත් ලාමා හිමිවරුන්ගේ කසාවත් හිස් පළඳනාව නිසා 'කසා හිස්වැසුම්ධාරීන්ගේ නිකාය' ලෙසද මෙය නම් කෙරේ. ක්‍රි. ව 15-16 සියවස්හිදී තිබ්බතයේ ගොඩනැගුන මෙම නිකාය

2 Сафронова, Е.С., Геополитические и социокультурные предпосылки распространения буддизма в Забайкалье и политика Российского государства в отношении буддизма в XVIII в.//История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС, 2004. С.461.

ධර්මයේ ශ්‍රේෂ්ඨත්වය තහවුරු කරන අතර, එහි ලාමා භික්ෂූන්ට විවාහවීම දැඩිව තහනම් කෙරේ. එහිලා ගුරු ලාමා වහන්සේගේ උත්තරීතරභාවය ඉහළට නැංවෙන අතර භික්ෂූන් වහන්සේගේ දැඩි ධුරාවලියක් නිර්මාණය වේ. එහි ඉහළින්ම සිටිනුයේ උත්තරීතර දලයි-ලාමාතුමා ය. එම පදවි නාමයේ අරුත වනුයේ 'මහා සාගරයක් වන් දැනුමැති ගුරුහිමියන් වහන්සේ' යනුයි. උන්වහන්සේ ආගමික නායකත්වයද තිබ්බතයේ රාජ්‍ය නායකත්වය ද දරයි. මෙම ගෙලුග් නිකායය විසින් මහායානික සහ වජ්‍රයානික මූලික ඉගැන්වීම් පිළිගැනේ.

රුසියාවේ බුද්ධාගම ව්‍යාප්තවීම සහ බෞද්ධ සංඝ සමාජය නිර්මාණය වීම යථෝක්ත බෞද්ධ ප්‍රදේශයන්හි රුසියානු අධිරාජ්‍යය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති හා සබැඳේ. මොංගෝලියාවේ හෝ තිබ්බතයේ මෙන් රජයේ මට්ටමින් පිළිගැනීමක් රුසියාවෙහි බුදුසසුනට හිමිව නොතිබුණද, රජයේ නියෝග, පරිපාලන විධාන ආදී නීතිමය ලියැවිලි මඟින් රජයේ නිල පිළිගැනීමට පාත්‍රව තිබිණි. එගොඩ බයිකාල ප්‍රදේශයේ (සාබයිකාලියේ) සහ ඉර්කුත්ස්ක් ප්‍රදේශයේ සංඝ සමාජ සංවිධාන කටයුතු සිදු වූයේ රුසියානු ආණ්ඩුවේ ක්‍රියාන්විත මැදිහත්වීමෙනි. මොංගෝලියාවේ **ජුන්ගාර් ඛාන්** පාලන ප්‍රදේශයේ (ඛානේටයේ) සිට රැගෙන එන ලද ආකාරයෙන් රුසියාවේ කාල්මිකියානු ඛානේටයේ සංඝ සමාජය වැඩෙන්නට විය. එසේ වුවත් රජය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමේ නීතිමය රෙගුලාසි සාර් ආණ්ඩුව විසින් නීති පනත් මඟින් තහවුරු කර තිබිණි.

තුවාහි (තිවා) බුදුසමය, එහි පැවති යකැදුරු කර්ම හා බැඳුණු ඇදහිලි පද්ධතිය සමඟ එකට බැඳී පවතී. එනමුත් එහි සංඝ සමාජය විසි වන සියවසේ ආරම්භයේදී පවා මොංගෝලියානු සංඝ සමාජයට යටත්ව තිබිණි. තුවා ප්‍රදේශය සෝවියට් සංගමයට ඇතුළත් වූයේ 1944 වර්ෂයේදීය. ඒ වනවිට කොමින්ටර්නයේ මෙහෙයැවීමෙන් එහි පිහිටා තිබූ බෞද්ධ සිද්ධස්ථාන 180කට අධික සංඛ්‍යාවක් විනාශ කර දමා තිබුණු බව සඳහන් වේ. එහෙයින් 1980

දශකයේ අවසානය දක්වාම එහි එකදු බෞද්ධ ඇදහිලිවන්තයින්ගේ සමාජයක් හෝ ලියාපදිංචි කර නොතිබිණි.

රුසියාවේ බුදුසමය අදහන්නා වූ ජනවර්ග තුන, එනම් බුරියාත්, කාල්මිකී සහ තුවා වාර්ගිකයින් එකට ඒකාබද්ධ කරන වැදගත්ම සාධකය වන්නේ තිබ්බත-මොංගෝලියානු සංස්කෘතියට සහ ආගමික සම්ප්‍රදායයට මෙන්ම, මහා මධ්‍ය ආසියාතික ශිෂ්ටාචාරයට ඔවුන් අයත්වීමය. මෙහිලා සඳහන් කළ යුතු විශේෂ කාරණයක් වන්නේ තුවා ජාතිකයින් තුර්කි භාෂා පවුලට අයත් ජනවර්ගයක් වන නමුත්, ඔවුන්ගේ සම්භවය, සංස්කෘතිය, දිවිපෙවෙත, වත්පිළිවෙත් මෙන්ම භාෂාව පවා සිය ඓතිහාසික සංවර්ධනයේදී මොංගෝලියානු සංස්කෘතියේ බලවත් බලපෑමට නතුවීමයි. බුදුසමය අදහන සෙසු ජාතීන් දෙවර්ගය වන කාල්මිකියානුවෝ සහ බුරියාතියානුවෝ සිය සම්භවයෙන් ද ස්වයංවිඥානයෙන් ද භාෂාවෙන් ද මොංගෝලියානු සංස්කෘතිය සමඟ අත්‍යන්තයෙන්ම බැඳී සිටිති. තිබ්බත ගෙලුග් බෞද්ධ නිකායයට අයත්වීම, රුසියාවේ වාසය කරන මෙම ජනවර්ග තුන එකට ඒකාබද්ධ කරන්නා වූ බලවත්ම සාධකය ලෙස පෙනී සිටී. ඉන්දියානු, චීන සහ මධ්‍ය ආසියාතික ඉපැරණි පෙරදිග සංස්කෘතීන්හි බොහෝ ජයග්‍රහණ ඔවුනට උකහාගත හැකි වූයේ තිබ්බත බුදුසමය නිසා ය.

බයිකාල් විලෙන් මෙගොඩ සහ එගොඩ යන පළාත් දෙකම ඇතුළත්වන නූතන බුරියාතියාව, මධ්‍යකාලීන මොංගෝලියාවේ සහ චීනයේ ඉතිහාසය සමඟ අතිශය සමීපව බැඳී සිටී. නොයෙක් මොංගෝලියානු රදළයින්ගේ යටත්වැසියන්ව සිටීමට එකී භූමියේ වාසය කළ ජනවර්ගයනට සිදුවිය. බුර්යාත් බුදුසමයේ ප්‍රාදේශීය හෝ ජාතික ස්වරූපය නිර්මාණය වීම සිදුවනුයේ බුර්යාතියාව රුසියාවට ඈඳාගැනීමේ ක්‍රියාදාමයට සමගාමීවය. එම ක්‍රියාදාමය සිදුවනුයේ බුර්යාතියානු ගෝත්‍රයනට සිය ඒකාබද්ධතාව පිළිබඳ වැටහීමක් හෝ ඔවුනට රාජ්‍යත්වයක් නොතිබියදීය. එහිලා මොංගෝලියානු රදළ නායකයින්ගේ යටත්භාවයෙන් මිදීම ද එක් අරමුණක් විය.

එම ප්‍රදේශයන්හි රුසියානු සාර් පාලනය සමඟ යම් ආරවුල් ඇති වීමට තුඩුදුන් කාරණයක් වූයේ රුසියාවේ ආධිපත්‍යය යටතට ස්වේච්ඡාවෙන් පැමිණි මෙම පිරිස අදහන බුදුසමය පිළිබඳ වැටහීමක් නොතිබීමත් සාර් පාලනයේ ප්‍රතිපත්තිය වූ රුසියානු ඕර්තඩොක්ස් කිතුනු දහම (Russian orthodox christianity) ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීමත් ය[3]. එහෙත් එකී ආගම ව්‍යාප්තියට දැරූ ප්‍රයත්නය එතරම් ප්‍රතිඵලදායී නොවීය. 1689 දී අත්සන් තබන ලද සාම සහජීවන ප්‍රකාශනයට අනුව, බුරියාතියානුවන් කිතුනු ආගමට හැරවීම හෝ ඊට බලකිරීම තහනම් කරනු ලැබිණි[4]. එහෙත් එකල පවා යකැදුරන්ගේ මූලිකත්වයෙන් පැවති පූර්ව ආගමික විශ්වාස එහි බලවත්ව පැවතිණි[5].

නැගෙනහිර මොංගෝලියාවේ සිට එගොඩ බයිකාල් ප්‍රදේශයට බුදුසමය ව්‍යාප්ත කිරීම උදෙසා ඥාති ගෝත්‍රික කණ්ඩායම් විසින් විශේෂ කාර්යභාරයක් ඉටුකරන ලදි. ඒ සමඟම බුර්යාතියාවේ රදළ වැඩවසම් පාලන ක්‍රමයේ ව්‍යාප්තිය ද සිදුවිය. 18 වන සියවසේ තුන් වෙනි දශකයේදී මෙගොඩ සහ එගොඩ බයිකාල ප්‍රදේශයන්හි විවිධ ජනවාර්ගික කණ්ඩායම් අතර බුදුසමයේ ව්‍යාප්තිය අනුක්‍රමයෙන් සිදුවිය. 16 වන සියවසේදී සිදුවූ බුදුසමය මොංගෝලියාවේ නිල ආගම ලෙස පිළිගැනීමටත් පෙර බුර්යාතියාවේ ප්‍රධාන ගංගාවක් වන සෙලින්ගා ගඟබඩ වාසය කළ ජනවාර්ගික කණ්ඩායම් විසින් අදහනු ලැබූයේ බුදුසමයයි. 1712 දී මොංගෝලියාවේ ඇති වූ අසහනකාරී සමාජ-දේශපාලන වාතාවරණය තුළ මොංගෝලියානු ලාමා වහන්සේලා සියනමක් සහ තිබ්බත ලාමා වහන්සේලා පනස් නමක් මොංගෝලියාවේ සිට බුර්යාතියාවට පළා ආහ. සාක්ෂරතාවෙන් හෙබි, ආගම දැනුමැති

3 Сборник документов по истории Бурятии XVII в. Вып. . Улан-Удэ, 1960. С.220.

4 Вашкевич, В. Ламаисты в Восточной Сибири, СПб., 1885, С.3.

5 Высочайше утвержденная под председательством статс-секретаря Куломзина Комиссия для исследования земледелия и землепользования в Забайкальской области: Материалы. Население, значение рода у инородцев и ламаизм Вып. 6. 1898. С.129.

භික්ෂූන් වහන්සේ පැමිණීමෙන් බුර්යාතියාවේ බුද්ධ ශාසනයේ අභිවෘද්ධියට ඉමහත් පිටුබලයක් ලැබිණි[6].

18 වන සියවස දක්වාම බුර්යාතියාවේ නිත්‍ය විහාරාරාම නොතිබිණි. ඊට හේතු වූයේ ඔවුන් ගෙවූ එඬේර ජීවන රටාවයි. නිත්‍ය වශයෙන් ස්ථානගත විහාරස්ථාන බිහිවීම ආරම්භ වූයේ 18 වන සියවසේ මැද භාගයේ සිට ය. බුදුසමය ස්ථාපිතවීමත් සමඟම මොංගෝල ලේඛන කලාව බුරියාතියානු ජාතිකයින්ට ලැබුණු අතර ඒ සමඟම පොදුවේ ගත් කල මොංගෝලියානු සංස්කෘතියේ බලපෑම ද උත්සන්න විය. 1727 දී චීනය සමඟ දේශසීමා නිර්ණය කර ගැනීමට පෙර මොංගෝලියානු සහ තිබ්බත ලාමා හිමිවරුන්ට නිදහසේ රුසියාවට පැමිණ සිය ආගම ප්‍රචාරය කිරීමේ අවස්ථාව හිමිව තිබිණි. 1728 දී දේශසීමා ආරක්ෂකයින් වෙත නිකුත් කරන ලද විධිවිධානයනට අනුව, ඉහත කී භික්ෂූන් වහන්සේට රුසියාවට පැමිණීම තහනම් කරන ලද නමුත් බුරියාත් තරුණයින්ට මොංගෝලියානු භාෂාව මෙන්ම බුදුදහම ඉගැන්වීම ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවත්, අනාගතයේදී ඔවුන් විසින් බුර්යාතියාවේ බෞද්ධ සංඝ පරපුර ස්ථාපිත කළ යුතු බවත් ඉන් කියැවිණ. එය රුසියාවේ බුදුසමය පිළිගැනීම හුවා දැක්වෙන පළමු නිල ලියැවිල්ල ලෙස සලකනු ලැබේ.

මොංගෝලියානු සංඝ පරම්පරාවෙන් වෙන් වූ වෙනම ඒකාබද්ධ සඟ පරපුරක් බුරියාතියාවේ බිහිවනු දැකීම රුසියාවේ සාර් ආණ්ඩුවේ මෙහෙයැවීමෙන් සිදුවූවක් විය. එය එගොඩ බයිකාල ප්‍රදේශයේ රුසියානු රාජ්‍යයේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම අරමුණු කරගත්තක් විය. 18 වන සියවසේ මැද, එනම් 1741 දී ඉදිකරන ලද සොන්ගෝල් විහාරයේ අධිපතිත්වයට පත්ව සිටි දම්බා දොර්ශි සයියායෙෆ් හිමියන් වෙත සාර් ආණ්ඩුව විසින් බයිකාල් විලට දකුණුදිග ප්‍රදේශයේ වාසය කළ සියලු බෞද්ධයින්ගේ

6 Сафронова, Е.С., Геополитические и социокультурные предпосылки распространения буддизма в Забайкалье и политика Российского государства в отношении буддизма в XVIII в.//История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС, 2004. С.465.

මහනායක පදවිය වන බන්දිදෝ-හම්බෝ-ලාමා (පණ්ඩිත මහා නායක) පදවිය ස්ථාපිත කර පවරන ලදි. 18 වන සියවසේ මුල් භාගයේදී එම ප්‍රදේශයේ ලාමා භික්ෂූන් 617ක් වැඩසිටි විහාරස්ථාන 16ක් තිබිණි. 19 වන සියවස වන විට සමහර ගෝත්‍රික සමාජයන්හි භික්ෂූන් වහන්සේ කොපමණ සිටියේ ද කිවහොත් ගිහි භවතුන් 100 දෙනකු සිටින විට භික්ෂූන් වහන්සේ 50 නමක් වූහ. මෙම තත්ත්වය රුසියානු සාර් ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන ලද ආගම් ප්‍රතිපත්තිය වූ රුසියානු ඕර්තඩොක්ස් ආගම ප්‍රචලිත කිරීමට බාධාවක් විය. එහෙයින් 1853 දී ආණ්ඩුවේ විධිවිධාන මඟින් නැගෙනහිර සයිබීරියාවේ සංඝාරාම සංඛ්‍යාව 34ක් දක්වාද ලාමා භික්ෂූන්ගේ සංඛ්‍යාව 285ක් දක්වාද සීමා කරන ලදි. බන්දිදෝ-හම්බෝ-ලාමා පදවියට පත්වන භික්ෂූන් වහන්සේගේ නාමය, රුසියාවේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විදේශ ආගම්හි ආධ්‍යාත්මික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත් විය යුතු විය. 20 වන සියවසේ දෙවන දශකය දක්වාම එම නීතිය ක්‍රියාත්මක විය. එහෙත් එම නීති ක්‍රියාත්මක කිරීමේදී ඕර්තඩොක්ස් සභාවේ අවශ්‍යතාවන්ට හානි වන පරිදි ලිහිල්භාවයක් පෑමට රුසියානු ආණ්ඩුවට සිදුවූයේ රුසියාවේ අසල්වාසී රටවල් වූ ටිබෙටයට සහ මොංගෝලියාවට ගෙලුග් බෞද්ධ නිකායය ඔස්සේ බලපෑමක් කිරීමට ඇති හැකියාව පිළිබඳ කල්පනා කළ හෙයිනි. තවද, ලාමා භික්ෂූන් වහන්සේ විසින් දරන ලද පදවියට අනුව, ඒ ඒ ආරාමයනට ඉඩම් කොටස් වෙන් කර දී තිබුණි. ඒ අනුව, හෙක්ටාර් 545ක (දෙස්යතීන 500ක) බිම් ප්‍රදේශයකට මහා නාහිමියන් හිමිකම් කී අතර හෙක්ටයාර් 218කට (දෙස්යතීන 200කට) සෑම පන්සලකම නාහිමිවරු හිමිකම් කීහ. එතෙක් ක්‍රියාත්මකව පැවති සියලුම පදවි අතරින් මහා නාහිමි පදවිය සහ සංඝාරාමාධිපති පදවිය හැර සෙසු සියලු පදවි අහෝසි කරනු ලැබිණි. ක්‍රියාත්මකව පැවති ආරාම හැර අලුත් ආරාම ඉදිකිරීමට මුදල් රැස්කිරීම තහනම් කෙරුණු අතර අග්‍රාණ්ඩුකාරගේ සහ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ අවසරයෙන් තොරව අලුත් ආරාම ඉදිකිරීම තහනම් කර තිබිණි.

එහෙත් ප්‍රායෝගික තලයේදී එකී තහනම් එපරිදිම ක්‍රියාත්මක නොවුණි. කුටුහ්ටා-ලාමා වහන්සේ ලෙස හැඳින්වෙන මොංගෝලියාවේ මහා නාහිමියන් වැඩවාසය කළ උර්ගා ප්‍රදේශය සමඟ දිගින් දිගටම සම්බන්ධතා පැවතියේය. එහි සිට භික්ෂූන් වහන්සේ පමණක් නොව බෞද්ධ වතාවත් සිදු කිරීම සඳහා අවශ්‍ය කරන භාණ්ඩ ද නිතර මොංගෝලියාවේ සිට ගෙන්වා ගනු ලැබිණි.

බුර්යාතියානුවන් විසින් සෑම නිවසකම භික්ෂූන් වහන්සේ නමක් වැඩසිටිනු දැකීමට දැක්වූ උනන්දුව නිසා සෑම නිවසකම (කුඩාරමකම) කිසියම් පමණකින් මොංගෝලියානු අක්ෂර කලාවත්, ඒ අනුව සාක්ෂරතාවත්, ඊට සමගාමීව බෞද්ධ පාණ්ඩිත්‍යයත් බුර්යාතියාවේ සාමාන්‍ය ජනයා අතර ව්‍යාප්ත විය. එය බුදුසමය සාමාන්‍ය ජනයා අතර පැතිරීමට අවශ්‍ය මූලික අඩිතාලම සැපයීය. සාර් පාලනය විසින් නිකුත් කරන ලද මේ සියලු නියෝග විසින්, අවසාන වශයෙන් බුර්යාතියාවේ ස්වාධීන සංඝ සමාජයක් ස්ථාපිත වීමටත්, එහි මොංගෝලියාවෙන් නිදහස් වූ ස්වාධීන සංඝ පරිපාලනයක් ස්ථාපිත වීමටත් අවශ්‍ය මංපෙත් නිර්මාණය කෙළේය[7]. එහෙත් එමඟින් ඒ සියල්ල සාර් පාලනය යටතට ක්‍රමාණුකූලව පත් කරනු ලැබිණි.

19 වන සියවසේ දෙවන අග භාගයේදී එගොඩ බයිකාලයේ බුදුසමයේ ව්‍යාප්තිය අතිශය ශීඝ්‍රයෙන් සිදු වූ අතර 19 වන සියවසේ අග වන විට බටහිර බුර්යාතියාවේද ව්‍යාප්තවීම ආරම්භ විය. එහෙත් පූර්ව ආගමික ඇදහිලි හා බැඳුණු කට්ටඩිගුරුකම් හා සම්බන්ධ ඇදහිලි පද්ධතියෙන් මෙන්ම ඕර්තඩොක්ස් සභාවෙන්ද ඊට බාධා පැණවිණ. ඒ කෙසේ වෙතත් 19 වන සියවසේ අග වන විට සකසන ලද සංඛ්‍යා ලේඛන අනුව, එගොඩ බයිකාල ප්‍රදේශයේ බෞද්ධයෝ 161,658ක්ද ලාමා භික්ෂූහු 5,545ක්ද සිටියහ. ලාමා භික්ෂූන්

7 Высочайше утвержденная под председательством статс-секретаря Куломзина Комиссия для исследования земледелия и землепользования в Забайкальской области: Материалы. Население, значение рода у инородцев и ламаизм Вып. 6. 1898. С.141.

සංඛ්‍යාව 1892-93දී එහි ජනගහනයෙන් 10%ක ප්‍රමාණයක් වූ බව ඕර්තඩොක්ස් නිකායික ශුද්ධ වූ සිනෝද් සභාවේ සංඛ්‍යා ලේඛන අනුව පෙනේ. ඒ අනුව, එගොඩ බයිකාලයේ ලාමා භික්ෂූන්ගේ සංඛ්‍යාව 15,000කට ආසන්න විය. ඔවුහු බහුතර පිරිස ගිහි ජීවිත ගත කළ අතර වගා හා සත්ත්ව පාලන කටයුතුවල නිරතවූහ[8].

කෙසේ වුවත් බෞද්ධ ආරාම සතුව තිබූ ආර්ථික ශක්තිය ප්‍රායෝගික තලයේදී නොවෙනස්ව පැවතිණි. සියලු ලාමා භික්ෂූන් ඉතාම හොඳ ඉඩම්වලටත්, ගෝනමහිශාදීන්ටත් හිමිකම් කී බව සිනෝද් සභාවේ ඉහත කී වාර්තාවේ සඳහන් වේ. ඒ අනුව, සමහර භික්ෂූන් වහන්සේ වෙළෙඳ කටයුතුවලත් මුදල් පොලියට දීමෙහිත් නිරතවූහ. එනිසා දිළිඳු ජනප්‍රජාව භික්ෂූන් වහන්සේ මත ආර්ථික වශයෙන් රැඳීසිටියහ.

බුර්යාත් සංස්කෘතිය ගොඩනැංවීමේදී පොදුවේ ගත් කල බුදුසමය විසින් එල්ල කරන ලද්දේ අතිවිශාල බලපෑමකි. ඒ අනුව, සංස්කෘතිය පමණක් නොව, ජාතික අනන්‍යතාව, කලාව, සාහිත්‍යය, වෛද්‍ය ශාස්ත්‍රය සහ දාර්ශනික චින්තාව කෙරෙහි බුදුසමය විසින් තීරණාත්මක බලපෑමක් ඇති කරන ලදි. එසේම රුසියාව විසින් එකී ප්‍රදේශ විජිතකරණයට බඳුන් කිරීමේදී ජාතික ඒකාබද්ධතාව සහ ස්වායත්තතාව රැකගැනීමට බුදුසමය විසින් ඉටුකරන ලද විශිෂ්ට කාර්යභාරයකි. බොහෝ බෞද්ධාරාම බෞද්ධ චින්තාවේ මධ්‍යස්ථාන බවට පත්විය. ඒවා සතුව පුස්තකාල, මුද්‍රණාල සහ දාර්ශනික පාසල් තිබිණි. නිල වශයෙන් එවැනි පාසල් පවත්වා ගැනීමේ අවසරය හිමිව තිබුණේ ගුසිනඅසියෝර්ස්ක් නමින් හැඳින්වුණු ප්‍රධාන ආරාමයට පමණක් වුවත්, සැබැවින්ම සෑම ආරාමයක්ම සතුව එවැනි ධර්ම පාඨශාලා තිබිණි.

19 වන සියවසේ අවසානයේදී රුසියානු සාර් ආණ්ඩුවේ පාර්ශ්වයෙන් බෞද්ධ සංඝ ශාසනයට හිමිව තිබූ ස්ථානය අහිමි කිරීමට උත්සාහ දැරුණු අතර බුර්යාතියානු බුද්ධිමතුන් අතර මෙන්ම භික්ෂූන් වහන්සේලා අතර ද පුනරුද ව්‍යාපාරයක් ඇතිවිය.

8 Там же. С.142-143.

එය බුර්යාතියාවේ නිදහස් ව්‍යාපාරය හා බද්ධ වූවක් විය. එය රුසියානු අධිපතිවාදයට, ජනයා රුසියානුකරණයට භාජනය කිරීමට සහ ක්‍රිස්තියානිකරණයට එරෙහි ව්‍යාපාරයක් විය. එම ව්‍යාපාරය සතුව ස්වකීය ආගමික අරමුණුද විය[9]. එහි ප්‍රධානතම දෘෂ්ටිවාදියෙක් වූයේ බුර්යාතියාවේ මහානායක හිමියන් වූ පණ්ඩිත අග්වාන් දර්ෂීයෙෆ් හිමිපාණන්ය. උන්වහන්සේ බුර්යාතියාවේ බුදුසමයේ සංවර්ධනය උදෙසාද රුසියානු-තිබ්බත සම්බන්ධතාවන් ගොඩනැගීමේද රුසියාව සහ බුදුසමය අදහන ලෝකය සමඟ අන්තර් සම්බන්ධතාවන් ගොඩනැගීමේදී ද සුවිශේෂ කාර්යභාරයක් ඉටු කෙළේය.

මෙම ව්‍යාපාරයේ එක් ප්‍රයත්නයක් වූයේ බෞද්ධ සංඝ සමාජය ප්‍රතිසංස්කරණයට භාජනය කිරීමයි. එහි හරය වූයේ 'මුල් බුදුසමය' කරා ආපසු හැරීයැම, එකී බුදුසමයට ආවේණික වූ බුදුසමයේ සදාචාර සාරධර්ම සහ පරමාදර්ශ පුනර්ජීවනය කිරීම විය. එම ව්‍යාපාරයේ තවත් පාර්ශ්වයක් වූයේ බෞද්ධ ආධ්‍යාත්මික වටිනාකම් සමඟ බටහිර සංස්කෘතිය සහ විද්‍යාව සංස්ලේෂණය කිරීමයි. එහිලා එතෙක් ආගමික වතාවත් සිදු කෙරුණු ටිබෙට් භාෂාව වෙනුවට, අනුගාමිකයින් වැඩිදෙනකුට පහසුවෙන් වටහාගත හැකි වූ මොංගෝලියානු භාෂාවෙන් සිදු කිරීමද ඇතුළත් විය. භික්ෂූන් වහන්සේලා බහුතරයක් පවා ටිබෙට් භාෂාව දැනසිටියේ ඉතා දුර්වල අන්දමිනි. 20 වන සියවස උදාවෙමින් පැවති අතරවාරයේ බුදුසමයේ ගැඹුරු දාර්ශනික, සාරධාර්මික, මනෝවිද්‍යාත්මක මූලයන් පුනර්ජීවනය කිරීමේ හැකියාව අධ්‍යාපනයක් ලබා සිටි ගිහි බුර්යාතියානු ජාතිකයෝ පමණක් නොව බෞද්ධ යතිවරයන් වහන්සේද දුටහ.

ක්‍රි.ව 19 වන සියවසේ අවසානය වන විට බුර්යාතියාවේ බලගතු ස්වාධීන බෞද්ධ සංඝ ශාසනයක් පැවතියේය. බෞද්ධ සංඝාරාම ප්‍රමාණයත් එහි වැඩවාසය කරන බෞද්ධ භික්ෂූන්

9 Герасимов, К.М., Ламаизм и национально-колониальная политика царизма в Забайкалье в XIX и начале XX в., Улан-Удэ, 1957.

වහන්සේලා ප්‍රමාණයත් අඩුකිරීමට එරෙහිවත්, ඉර්කුත්ස්ක් පළාතේ තම බලපෑම උත්සන්න කිරීමටත්, නව ආරාම ඉදිකිරීමටත් ඔවුහු අවස්ථාව සලසාගත්හ. එසේම ස්වකීය ආධ්‍යාත්මික අයිතිවාසිකම් කළමනාකරණය කිරීමටත් එසේම එකී අයිතීන් උල්ලංඝනය කිරීමටත් එරෙහිව කටයුතු කළ ඔවුහු එහිලා ප්‍රාදේශීය පරිපාලනයට මෙන්ම මධ්‍ය ආණ්ඩුවේ පාලනයටද එරෙහිව පෙනී සිටියහ. එය යට කී පළාතේ පමණක් නොව වෙනත් ප්‍රදේශයන්හිද ජනයා බුදුසමය වෙත ආශක්ත කර ගැනීමට හේතුවක් විය.

ක්‍රි.ව 20 වන සියවස ආරම්භ වන විට එගොඩ බයිකාල් ප්‍රදේශයේ හා කාල්මිකියාවේ ලාමා භික්ෂූන් සංඛ්‍යාව විසි දහසක් වූ අතර ආරාම 150ක් පමණ ක්‍රියාත්මකව පැවතිණි. ඒ අතර රුසියාවේ අගනුවර වූ ශාන්ත පීටර්ස්බර්ග් නුවර විවෘත කරන ලද යුරෝපයේ පළමු බෞද්ධ ආරාමයද විය. රුසියාවේ සංස්කෘතියේ රජත යුගයේ බොහෝ නියෝජිතයෝ සිය නිර්මාණකරණයේදී බුදුසමය කෙරේද අවධානය යොමු කළහ. රුසියානු විප්ලව සමයේ ආණ්ඩුව විසින් පිළිගැනුණු නිල ලියවිලිවලට අනුව, නිදහසේ ආගම ඇදහීමට හෝ නොඅදහා සිටීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබිණි[10]. එය රුසියාවේ බුදුසමයේ දියුණුතම කාල පරිච්ඡේදය බවට පත්විය. රුසියාවේ බුදුසමයේ පුනරුදය ව්‍යාපාරයේ දෙවන යුගය සනිටුහන් වූයේ 1917-1929 කාල පරිච්ඡේදයේදීය. කාල්මිකියාවේ නව ආරාම රාශියක් විවෘත වූ අතර ඒවාට නිල පිළිගැනීමක් ලැබුණි. මෙකල ආස්ත්‍රහාන්, දොන්, උරාල්, ඔරෙන්බූර්ග් ප්‍රදේශයන්හි බුදුසමය වේගයෙන් ව්‍යාප්ත විය[11]. ඒ ප්‍රදේශ බොහොමයක් ඕර්තඩොක්ස් සභාවේ බලපෑමට නතුව තිබූ ප්‍රදේශ විය.

10 Декрет о свободе совести, церковных и религиозных обществах за 20 января (02 февраля) 1918 г.//Декрети советской власти. Т.1, М., Госиздательство политической литературы, 1957. С.373-374.

11 Сафронова Е.С. Буддизм в начале XX в. и борьба за его сохранение в конце 20-х-начале 30-х гг.// История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС, 2004. С.480.

එවැනිම ක්‍රියාදාමයක් බුර්යාතියාවේද සිදුවිය. එහිද පැරණි ආරාම ප්‍රතිසංස්කරණය කෙරුණු අතර නව ආරාමද ඉදිකෙරිණි. පෙබරවාරි විප්ලවයෙන් පසු කාලයේදී සහ සෝවියට් පාලනයේ මුල් සමයේදී බුර්යාතියාවේ පූජ්‍යස්ථාන 11ක් ඉදි කෙරුණු අතර ඒවා පසු කලෙකදී ආරාම බවට දියුණු කිරීම අරමුණ විය. බෞද්ධ දර්ශනය උගන්වන පාසල්හි කටයුතු නිල වශයෙන් ලියාපදිංචි කිරීමට ක්‍රමාණුකූලව කටයුතු සිදු කරනු ලැබිණි. එවැනි පාසල් දෙකක් කාල්මිකියාවේ ඉදිකෙරිණි. තවද මෙම අවධියේදී කාල්මියානු බුදුසමය බුර්යාතියානු මෙන්ම මොංගෝලියානු බුදුසමය සමඟද සමීප සම්බන්ධතාවන් ගොඩනැඟිණි. ඊට බලවත් බලපෑමක් බුර්යතියානු බුදුසමය කෙරෙන් එල්ල විය. සෝවියට් පාලනය ස්ථාපිතවීම සහ සිවිල් යුද්ධ සමයේ බුදුසසුන ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාදාමය බුර්යාතියාවේ මෙන්ම කාල්මිකියාවේද තවදුරටත් සිදුවිය. එහෙත් මේ සඳහා වැඩි කාලයක් ඉතිරි වී නොතිබිණි. මක්නිසාද යත් ආගම පාලනය කිරීමේ දැඩි විධිවිධාන පැනවීමට ආසන්නව තිබූ හෙයිනි. එහෙයින් ඕර්තඩොක්ස් සභාව අනුව යමින් නව පාලනය බෞද්ධයින් විසින්ද පිළිගන්නා බව කල්තියා නිවේදනය කරනු ලැබිණි. ඒ සමඟම සංඝ සමාජයේද ප්‍රබල වෙනස්කම් සිදු කිරීමට, එනම් ආරාමික ඉඩම් සහ දේපළ ජනසතුකිරීම, කෘෂිකාර්මික ජන සංගම් ගොඩනැඟීම, එදිනෙදා ජීවිතයේ මෙන්ම භික්ෂූන් වහන්සේගේ ඇඳුමෙහි පවා අනවශ්‍ය සුඛෝපභෝගිත්වයෙන් මිදීම වැනි කාරණා කෙරේ ඇති සූදානම පළ කරනු ලැබිණි. එසේම පුනරුද ව්‍යාපාරයට සම්බන්ධවූවෝ බුද්ධාගමේ සහ කොමියුනිස්ට්වාදයේද එසේම නූතන විද්‍යාවේද අදහස් එකට ගැලපීමට ප්‍රයත්න දැරූහ. කොමියුනිස්ට් සහ බෞද්ධ අදහස් සහ පරමාදර්ශ අතර සාම්‍යත්වය හුවා දැක්වූ ඔවුහු 'බෞද්ධ සමාජවාදය' පිළිබඳ න්‍යායයක් ඉදිරිපත් කළහ. සමානාත්මතාව, පෞද්ගලික දේපළ අයිතිය ප්‍රතික්ෂේප කිරීම, මිනිසා තුළ ඇති ආත්මාර්ථකාමී මූලයන් වැනි බෞද්ධ අදහස් සහ කොමියුනිස්ට් අදහස් අතර ඇති සාම්‍යත්වය සොයා බැලීමට ඔවුහු සැබෑ ලෙසම උත්සාහ දැරූහ[12]. මුල් සමයේදී එකී අදහස් නව පාලනය විසින්

12 Там же. С.481.

ධනාත්මකව අගය කරනු ලැබිණි. ඒ හා සමගම බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ බෙදීමක් ඇති වනු දැකීමද එහි අභිලාශය විය. එහි පරමාර්ථය වූයේ එකී ව්‍යාපාරය දුර්වල කිරීමය.

1922 සහ 1925 දී බුර්යාතියාවේද 1923දී කාල්මිකියාවේද පැවති සංඝ සම්මේලයන්හිදී නව නීති ලියවිලි පිළිගැනීම සම්බන්ධයෙන් වාදවිවාද ඇතිවිය. එමඟින් අපේක්ෂා කෙරුණේ සෝවියට් පාලනය යටතේ සංඝ සමාජය සහ නව ආණ්ඩුව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා කළමනාකරණය කිරීමයි. 1922 සම්මේලනයේදී සංඝ සමාජය පරිපාලනය කිරීමේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී නව ආයතන පිහිටුවාලීමයි. ඒ සඳහා මහානාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවති සංඝ සභාවක් පිහිටුවනු ලැබිණි. ආරාම පාලනය සඳහා ආරාමික සෝවියට් සභා පිහිටුවනු ලැබිණි. එහිලා බහුතර ඡන්දයෙන් තීරණ ගත යුතු විය. ආගමික කටයුතුවලදී ගිහියන්ගේ සහභාගිත්වය මෙහිලා විශේෂයෙන් සැලකිල්ලට ගැනුණි. ආරාමික සහ සාංඝික දේපළ පොදු දේපළ බවට පත්කිරීමටත් භික්ෂූන් වහන්සේ සිවිල් නීතියට යටත් කිරීමටත් මෙහිලා අදහස් ඉදිරිපත් විය. මහනාහිමියන් විසින් ඕර්තඩොක්ස් සභාව විසින් ගෙන තිබූ තීන්දු පිළිබඳව සලකා බලා සුඛෝපභෝගී භාණ්ඩ සහ ඇඳුම් පැළඳුම් භාවිතය අත්හරින ලෙස උපදෙස් දුන්හ.

සෝවියට් ආණ්ඩුව විසින් 1918 ජනවාරි 23 දා නිකුත් කරන ලද 'රාජ්‍ය පාලනයෙන් සහ අධ්‍යාපනයෙන් ආගම වෙන්කිරීම' පිළිබඳ නියෝගයට අනුගත වෙමින්, සංඝ සභාවේ ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට පුනර්ජීවනවාදියෝ උත්සාහ දැරූහ. එහිලා සලකා බැලුණු ප්‍රධාන කාරණා වූයේ සෝවියට් පාලනය කෙරේ හිතවාදී ආකල්පයක් ඇති කිරීමත්, සමාජවාදී සමාජ ක්‍රමය විසින් පිළිගන්නා ලද සම්මතයන්ට අනුගත වන පරිදි සංඝ සමාජයේ පරිපාලන ක්‍රමය සහ ඔවුන්ගේ දෛනික දිවිපෙවෙත ස්ථාපිත කිරීමත් එහි අභිප්‍රාය විය. එයින් අපේක්ෂා කරන ලද්දේ බෞද්ධාගම ආරක්ෂා කර ගැනීමයි. එවැනිම ක්‍රියාදාමයක් කාල්මිකියාවේද සිදුවිය.

1918 නියෝගය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් සොයා බැලීම සිදුවූයේ පක්ෂ සංවිධාන මඟිනි. එසේම, පනවන ලද නව නීති උපයෝගී කර ගනිමින් බෞද්ධ භික්ෂූන් වහන්සේ සතුව තිබූ දේශපාලන සහ ආර්ථික බලගතුභාවය මෙන්ම මහජනයා කෙරේ ඔවුනට කළ හැකිවූ දෘෂ්ටිවාදී බලපෑම බිඳදැමීමට ඔවුහු ප්‍රයත්න දැරූහ. එය සිදු කිරීමට පාලකයින්ට හැකි වූයේ සාම්ප්‍රදායිකවාදීන් සහ පුනර්ජීවනවාදීන් අතර පැවති භේදය නිසාය.

1923-24 දී බුර්යාතියාවේ ආරාමික දේපළ ජනසතු කෙරුණු අතර ආගමික ගොඩනැගිලි නගර සභා කටයුතු සඳහා භාවිත කිරීමට පටන් ගැනුණි. ඒ සමගම ලාමා භික්ෂූන්ට බදු පනවනු ලැබිණි. එය සංඝ සමාජයේ විරෝධයට පමණක් නොව ආගමික බැතිමතුන්ගේ විමතියටද හේතුවිය. කෙසේ වෙතත් මේ තත්ත්වය පුනර්ජීවනවාදීන් සහ සාම්ප්‍රදායිකවාදීන් අතර මතභේදය තවත් ගැඹුරු කිරීමට හේතු වූ අතර සමහර භික්ෂූන් වහන්සේ ප්‍රදර්ශනාත්මකව මොංගෝලියාවට යෑමට පවා තුඩුදුන්නේය. 1927 ජනවාරි මාසයේදී මොස්කව් නුවර පැවති සමස්ත සංගමික බෞද්ධ සම්මේලනය විසින් සෝවියට් සංගමයේ බෞද්ධ භික්ෂු නියෝජිත මණ්ඩලයක් තොරාගනු ලැබිණි. එහි නිල නිවස පිහිටුවනු ලැබුවේ ශාන්ත පීටර්ස්බර්ග් නුවර බෞද්ධ ආරාමයෙහිය. 1920 දශකය ආරම්භ වන විට බුර්යාතියාවේ භික්ෂූන් වහන්සේ 7300 නමක්ද කාල්මිකියාවේ 1441ක් නමක්ද සිටි බව සංඛ්‍යා ලේඛන මඟින් අනාවරණය වේ[13].

බෞද්ධ භික්ෂූන් වහන්සේ අතර පැවති භේදය අවසන් වූ වසර ලෙස සඳහන් කළ හැක්කේ 1929 අවුරුද්දයි. ඒ වසර සෝවියට් ඉතිහාසයෙහි සඳහන් වනුයේ 'මහා බණ්ඩනයේ වසර' ලෙසිනි. එහිලා ජනතාව මහා පරිමාණ වශයෙන් සමූහ ගොවිපල්කරණයට භාජනය කිරීමත් ධනවත් කුලාක් ගොවියන්ට විරුද්ධව සටන් ආරම්භ කිරීමත් සනිටුහන් විය. භික්ෂූන් වහන්සේ අත්අඩංගුවට ගැනීමටත් මර්දනයට ලක් කිරීමත් ආරම්භ වූයේ එම වසර ආරම්භවීමටත් පෙර සිටය. මෙහි ප්‍රධාන ලක්ෂණ වූයේ භික්ෂූන්

13 Антирелигиозник. 1927. №.3. С.48.

වහන්සේ ධනපති මූලිකාංගයක් ලෙස සැලකීමට පටන්ගැනීමත්, උන්වහන්සේගේ සිවිල් අයිතිවාසිකම් අහෝසි කිරීමත්, සාමයික කටයුතු සම්පූර්ණයෙන්ම රජයේ අධීක්ෂණය යටතට ගැනීමත්ය. 1930න් පසු ලාමා භික්ෂූන් ධනේශ්වර මූලිකාංගයක් සේ සලකා ඔවුනට එරෙහිව පන්ති අරගලයක් ආරම්භ විය. ඉන්පසු භික්ෂූන් වහන්සේ විශාල වශයෙන් ආරාම අතහැර යෑමත්, විදෙස් රටවලට පලායැමත් නිරීක්ෂණය විය. 1940 දශකයේ අවසානය වන විට බෞද්ධ සංඝ සමාජය මෙන්ම, ආරාම පද්ධතියද, ශිෂ්‍ය භික්ෂු සංස්ථාවද, සමයයක් වශයෙන් බුද්ධාගමද මුළුමනින්ම පාහේ විනාශයට පත්කෙරිණි. එහෙත් එදිනෙදා ජීවිතයේදී සිය සමයය පවත්වාගෙන යෑමට අනුගාමිකයෝ උත්සාහ ගත්හ. බුදුසමය රැකගැනීමට, යට කී ආයතන රැකගැනීමේ අවශ්‍යතාව පෙන්වාදීමට, ඉතා කෙටි කලකට තිබ්බතයේ පූර්ණ බලධාරී රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයා ලෙස සෝවියට් සංගමයේ පෙනී සිටි අග්වාන් දර්ෂීයෙෆ් මහනාහිමියෝ සෝවියට් සංගමයේ උසස් ආයතන සියල්ලටම ලිපි, යෝජනා සහ අයදුම් ඉදිරිපත් කරමින් උත්සාහ දැරූහ. එහෙත් ඒ කිසිවකට උන්වහන්සේට පිළිතුරු නොලැබිණි. ආගම දෘෂ්ටිවාදාත්මකව හානිදායක යැයි එකල පිළිගෙන තිබූ හෙයිනි.

කාල්මිකියාවට මෙම තත්ත්වය විශේෂ වශයෙන් බලපෑවේය. 1943 දී කාලිමිකියානුවන් සෝවියට් සංගමයේ නැගෙනහිර ප්‍රදේශ කරා බලහත්කාරයෙන් පිටුවහල් කරනු ලැබූ අතර කාල්මිකියානු ස්වයංපාලන ප්‍රදේශය අහෝසිකර දමනු ලැබිණි. 1957 දී එය යළි පිහිටුවනු ලැබුවත් 1980 දශකයේ අවසානය වන තෙක් බෞද්ධ සංඝ පරපුරක් එහි නිල වශයෙන් ලියාපදිංචි කර නොතිබිණි. එසේම භික්ෂූන් වහන්සේට නිල පිළිගැනීමක්ද නොවීය. 1940 දශකයේ ආරම්භය වන විට රුසියාවේ එකදු සංඝාරාමයක් හෝ පන්සලක් හෝ ලාමා භික්ෂු පරපුරක් හෝ නිල වශයෙන් නොපැවැත්තේය[14].

14 Сафронова Е.С. Буддизм в начале XX в. и борьба за его сохранение в конце 20-х-начале 30-х гг.// История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС, 2004. С.487.

එහෙත් 1941 දී සෝවියට් ජනයාට මුහුණදීමට සිදුවූ ෆැසිස්ට් විරෝධී ශ්‍රේෂ්ඨ දේශප්‍රේමී යුද සමයේදී කිසියම් ආගමික නිදහසක් සියලු ආගම්වලට ලැබුණු අතර සෝවියට් බෞද්ධයෝද ඒ අවධියේදී පුනරුද ව්‍යාපාරයක් ආරම්භ කළහ. සටන් පෙරමුණ බලා යන සොල්දාදුවනට ආශිර්වාද කරමින් සැරිසරන භික්ෂූන් වහන්සේ සමුදායයක් එකල බුර්යාතියාවේ පහළ විය. පී. දොර්ෂි, බී. දන්දරෝන්, ධර්මායෙෆ් වැනි නිදහස ලැබූ භික්ෂූහු සමහර විහාරස්ථාන විවෘත කිරීම සඳහා අවසර පැතූහ[15]. යුද්ධය අවසන් වීමෙන් පසු 1946 දී පැවති බෞද්ධ ක්‍රියාකාරකයින්ගේ සම්මේලනයේදී බෞද්ධ සංඝයා වහන්සේ සහ සෝවියට් ආණ්ඩුව අතර සහයෝගීතාව පවත්වා ගැනීමේ මූලික ප්‍රතිපත්ති ඇතුළත් ලියැවිල්ලක් සම්මත කරගන්නා ලදි. එහිලා බෞද්ධ සංඝයා වහන්සේගේ දේශප්‍රේමී අභිලාශයන් තහවුරු කෙරුණු අතර සමාජවාදී සමාජ ක්‍රමය කෙරේ ඔවුන්ගේ පක්ෂපාතිත්වයද ප්‍රකාශයට පත් කරනු ලැබිණි. ඉවොල්ගින්ස්කි ආරාමය ඇතුළු බෞද්ධ විහාර කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීමට අවසර ලැබිණි. ඒ සමඟම, ජාත්‍යන්තර බෞද්ධ සංවිධාන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමටද අවසර හිමිවිය. ඒ අතරින් මහාචාර්ය ගුණපාල මලලසේකර මහත්මා විසින් ආරම්භ කෙරුණු ලෝක බෞද්ධ සහෝදරත්වයද ආසියානු බෞද්ධ සාම සම්මේලනයද ප්‍රධානය[16].

වර්තමානයේ බුදුසමය සිය සාම්ප්‍රදායික ව්‍යාප්තිත ප්‍රදේශයන්හි පමණක් නොව ඓතිහාසික වශයෙන් බුදුසමය සිය මූලයන් මුදා නොහළ රුසියාවේ වෙනත් ප්‍රදේශයන්හිද ව්‍යාප්ත වෙමින් පවතී. එකී බොහෝ බෞද්ධ පිරිස් නොයෙක් රටවල බෞද්ධ ගුරුකුල සම්ප්‍රදායයන් සමඟ බැඳී සිටීම වැදගත් ලක්ෂණයකි. එහෙත් ඒවා බොහොමයක් බටහිර

15 Сафронова Е.С. Восстановление ЦДУБ и буддизм в России в настоящее время.// История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС, 2004. С.488.

16 Сафронова Е.С. Восстановление ЦДУБ и буддизм в России в настоящее время.// История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС, 2004. С.489.

යුරෝපයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ බෞද්ධ මධ්‍යස්ථානයන්ගෙන් ආභාසය ලැබූවන් බව පර්යේෂකයෝ පෙන්වාදෙති. එසේම සෝවියට් සංගමයේ බෞද්ධයින් එකාබද්ධ කළ සංවිධාන ව්‍යුහයක් පැවතුනද එකම සම්ප්‍රදායයකට (ටිබෙට් ගෙලුග් නිකායය) අයත් වුවත් ජාතිකත්ව භේදය අනුව වත්මනෙහි විවිධ ප්‍රාදේශීය සංවිධාන නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

ඒ අනුව, වත්මන් රුසියාවේ බුදුසමය විවිධත්වයක් දරන බව පැහැදිලි වේ. එසේම, කෙතරම් සංකීර්ණතාවන් පැවතියද, රුසියාවේ බුදුසමය වේගයෙන් පුනරුදයට පත්වන අයුරු දිස්වේ. බෞද්ධ ඇදහිලි පද්ධතිය සහ දර්ශනය මෙන්ම බෞද්ධ භාවිතය (පන්සල් යෑම, වතාවත් කිරීම, බෞද්ධ උත්සව සැමරීම, භාවනා ආදී) දියුණුවට පත්වන අයුරුද අනන්‍ය ලක්ෂණයක් වේ. තවද, රුසියාවේ මෙන්ම වෙනත් බෞද්ධ රටවලද රුසියාවේ භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් බෞද්ධ ආරාමික අධ්‍යාපනයත්, බෞද්ධ පර්යේෂණාත්මක අධ්‍යාපනයත් ලබන අයුරු ද පෙනේ. එසේම, ඉන්දියාවේ සහ නේපාලයේ බෞද්ධ සිද්ධස්ථාන වන්දනා කිරීමටද බොහෝ රුසියානු බෞද්ධයෝ ලැදියාවක් දක්වති. එය නුදුරු අනාගතයේදී රුසියාවේ බුදුසමයේ ගුණාත්මක වෙනසක් ඇති කිරීමට හේතුවනු ඇති බව පෙනේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Андреев А. 1927, И. Буддийская святыня Петрограда. Улан-Удэ

Антирелигиозник. №.3.

Вашкевич, В. 1885, Ламаисты в Восточной Сибири. СПб.

Высочайше утвержденная под председательством статс-секретаря Куломзина Комиссия для исследования земледелия и землепользования в Забайкальской области: Материалы. 1898, Население, значение рода у инородцев и ламаизм Вып. 6.

Герасимов, К.М., 1957, Ламаизм и национально-колониальная политика царизма в Забайкалье в XIX и начале XX в., Улан-Удэ .

Декрети советской власти. Т.1, М., 1957, Госиздательство политической литературы.

Сафронова Е.С. 2004, Буддизм в начале XX в. и борьба за его сохранение в конце 20-х-начале 30-х гг.// История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС.

Сафронова Е.С. 2004, Восстановление ЦДУБ и буддизм в России в настоящее время.// История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС.

Сафронова, Е.С. 2004 Геополитические и социокультурные предпосылки распространения буддизма в Забайкалье и политика Российского государства в отношении буддизма в XVIII в.//История религий в России. Учебник. Под общ. ред. О.Ю. Васильевой и др., М., Издательство РАГС.

Сборник документов по истории Бурятии XVII в. Вып. Улан-Удэ, 1960.